# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / **Director General** | දුරකථන / தொலைபேசி / **Telephone** | **+94 11 2484729** | ෆැක්ස් / பெக்ஸ் / **Fax** | **+94 11 2431498** | ඊ-මේල් / மின்-அஞ்சல் / E-mail: **dgto@tod.treasury.gov.lk** |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number | TO/REV/M2/07/2010 | ඔබේ අංකය / உமது இல / Your Number | දිනය / திகதி / Date: 2018.05.24 |

**භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 02/2018**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

## 2018.06.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛය සහ ඒ සඳහා කරනු ලැබූ සංශෝධන ඇතුලත් 2016.12.30 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) කෙරෙහි අවධානය යොමු කෙරේ.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් මු.රෙ.128(2)(ඇ) විධිවිධාන ප්‍රකාරව තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් /ගණන්දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| ආදායම් සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.01.99 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොලිය - අනෙකුත් |
| 20.03.01.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ |
| 20.03.03.02 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම්- අනෙකුත් |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනිකුත් ලැබීම් |

03. එබැවින් ඉහත දැක්වෙන එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද ආදායම් සංකේතාංක සඳහා වන හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 සඳහන් පරිදි අමුණා ඇති TOD/REV/01 ආකෘති පත්‍රය අනුව 2018.06.30 දිනට සකස්කරන ලද හිඟ ආදායම් වාර්තා 2018.07.12 දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපිව 2018 වර්ෂයේ මුල් හය මාසය තුලදී අයකරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලපරිච්ඡේදය තුළදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද එක් එක් ආදායම් වේ නම් ඒ පිළිබඳ විස්තරද අමුණා ඇති TOD/REV/02 ආකෘති පත්‍රයේ සඳහන් කර ඉදිරිපත් කළ යුතුවේ.

05. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) ප්‍රකාරව ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ඔබ විසින් නිසි පරිදි පවත්වා ගත යුතුය.

සී.ජේ.කේ. පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් : 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආකෘති පත්‍ර අංක - TOD/REV/01

# 2018.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. ව්‍යවස්ථාපිත අධිකාරිය - ( අදාල අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ) ...............................................................................

II. ආදායම් අයිතමය - ......................................................................................

III. ආදායම් සංකේතාංකය - ......................................................................................

| විස්තරය | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනිම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනිමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු. | 2016 වසරට අදාල හිඟ මුදල රු. | 2017 වසරට අදාල හිඟ මුදල රු. | 2018.06.30 දක්වා අදාල හිඟ මුදල රු. | 2018.06.30 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු. | * | * | * |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2017.12.31 දිනට ඉදිරිපත් කල හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2018 වර්ෂයේ මුල් මාස 6 දක්වා වන අයවීම් ඇතොත් ඒවා අඩු කල පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

* 7 , 8 සහ 9 තීරු සඳහා වලංගු හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය.

**සකස් කලේ :** ..........................................................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි

**පරීක්ෂා කලේ:** ..........................................................................

**ප්‍ර.මු.නි./අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරී/ගණකාධිකාරී**

..........................................................................

**ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්**
**(නිල මුද්‍රාව)**

දිනය:................................

ආකෘති පත්‍ර අංක - TOD/REV/02

# 2018.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :

ආදායම් සංකේතාංකය :

| විස්තරය | 2018 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරිම | | | | * 2018 වර්ෂයේ මුල් මාස හය තුල හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2016 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2017 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | 2015.12.31 දක්වා | | 2016 | | 2017 | | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) |
| | | | | | අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | |
| | රු. | රු. | රු. | රු. | රු. | | රු. | | රු. | | රු. |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| | | | | | | | | | | | |

* එක් එක් ආදායම් සංකේතාංක යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කල යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

**සකස් කලේ :** ..........................................................

**ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි**

**පරීක්ෂා කලේ:** ..........................................................................

**ප්‍ර.මු.නි./අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරී/ගණකාධිකාරී**

..........................................................................

**ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්**
**(නිල මුද්‍රාව)**

**දිනය:...............................**